රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 02/97(1)

මගේ අංකය: 1/543ඊ/01/21
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997 .04.30 දින.

සියළුම ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**1997 වැටුප් ප්‍රතිශෝධනය.**

1997.01.15 දිනැති අංක 02/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ.

1. **වැටුප් කාණ්ඩ සහ වැටුප් පරිමාණ,**

1:1 පරිශිෂ්ට 1 හි සඳහන් ටී-10-3-2 වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරෙන අතර මීට යාකොට ඇති ඇමුණුම් 1 පරිවර්තන චක්‍රය පරිශිෂ්ට 111 ට ඇතුලත් විය යුතුය.
රු. 179520-10x8160-261120

1:2 පරිශිෂ්ට 1 හි ටී-10-2-1 වැටුප් කාණ්ඩයට පසුව පහත සඳහන් වැටුප් කාණ්ඩය ඇතුලත් විය යුතු අතර මීට යොකොට ඇති ඇමුණුම 11 පරිවර්තන චක්‍රය පරිශිෂ්ට 111 ට ඇතුලත් විය යුතුය.

| **වැටුප් කාණ්ඩය** | **1997 නව වැටුප් පරිමාණය** |
|---|---|
| ටී-10-2-2 | රු.107160-3x2700-4x4080-5x5520-159180 |

1:3 පහත සඳහන් තනතුරු/ශ්‍රේණි පරිශිෂ්ට 11 ට ඇතුලත් විය යුතුය.

| සේවාව/තනතුර | වැටුප් කාණ්ඩය |
|---|---|
| දන්ත ශල්‍ය වෛද්‍ය 1 පන්තිය | ටී-10-3-1 |
| 11 පන්තිය | ටී-10-2-2 |

2. **දීමනා**

2:1 3:1 ඡේදයේ (ඌ), (එ) හා (ඔ) ඡේද ඉවත් කරන අතර, ඒවායේ සඳහන් දීමනා 1997 නව වැටුප්වලට ඒකාබද්ධ නොවූවා සේ සැලකිය යුතුය.

2:2 පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශේණියේ නිලධාරීන්ට ගෙවන ලද රු.3000/- ක්වූ පරිපාලන දීමනාව, දීමනාවක් වශයෙන් තවදුරටත් ගෙවිය යුතුය. පශ්චාත් උපාධි සුදුසුකම් නොමැති වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට ගෙවන ලද රු. 2500/- ක්වූ දීමනාව දැනට ලැබෙන නිලධාරීන්ට පමණක් සීමා විය යුතුය. ඔවුන්ට 1997.12.31 දක්වා අනුග්‍රහ කාලයක් ලබා දෙන අතර, එදිනෙන් පසු එම රු. 2500/- දීමනාව නතර කළ යුතුය.

2:3 අංක 3:2 ඡේදය ද ඉවත් කරන අතර, රු.3000/- ක් වූ ප්‍රවාහන දීමනාව දීමනාවක් වශයෙන් දිගටම ගෙවිය යුතුය. ඉන්ධන දීමනාව ලබන නිලධාරීන්ට 1997.05.01 දින සිට මෙම ප්‍රවාහන දීමනාව හිමි නොවේ.

2:4 අංක 3:4 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

3:4 රාජ්‍ය අංශයේ ගෙවනු ලබන අනිකුත් දීමනා සහ දිරි දීමනා ආදිය පිළිබඳව නැවත සලකා බැලීම පිණිස කමිටුවක් පත් කිරීමට රජය තීරණය කර ඇත. උක්ත කමිටුව මගින් එම දීමනා සලකා බැලෙන තෙක් එම දීමනා1996.12.31 දිනට පැවැති මූල්‍ය වටිනාකම් ප්‍රමාණයේ නතර කළ යුතුය.

2:5 අංක 3:4 ඡේදයට පසුව පහත සඳහන් ඡේදය ඇතුළත් විය යුතුය.

3:5 මෙම ඡේදය යටතේ සඳහන් දීමනා සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව අනුව දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ට ද අදාළ වේ.

3. දෛනික වැටුප්/ දීමනා

ආධුනික වෛද්‍ය නිලධාරීන් සඳහා 1997.01.01 දින සිට රු. 8075/- ක හා 1998.01.01 දින සිට රු. 9000/- ක ඒකාබද්ධ දීමනාවක් ගෙවනු ඇත. චක්‍රලේඛයේ 1V වන පරිශිෂ්ටය ඒ අනුව සංශෝධනය විය යුතුය.

04. චක්‍රලේඛයේ පහත සඳහන් සංශෝධනයක් ද සටහන් කරගන්නේ නම් මැනවි

(1) 64 වැනි පිටුවේ වැටුප් පරිමාණය රු. 45900-14x1320-6x1560-73740 වශයෙන්

(11) 75 වැනි පිටුවේ සඳහන් වී ඇති ටී-3-2-1 දරණ වැටුප් පරිමාණයට අදාළ පරිවර්තන චක්‍රය යාකොට ඇති ඇමුණුම 111 අනුව නිවැරදි විය යුතුය.

05. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.